**ශීර්ෂය 269 - මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය/ කච්චේරිය පිළිබඳ විගණකාධිපති වාර්තාව**
**2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශය, මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් විගණනයට ඉදිරිපත් කරන ලදි. එම ගිණුමෙන් හා සැසඳුම් ප්‍රකාශනයෙන් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදි.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත්කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වේ. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම හා සැසඳුම් ප්‍රකාශනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

---

ශීර්ෂය 269 - මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනයන් සම්බන්ධයෙන් සැලසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල වීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 ජූලි 06 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනු වල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

---

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.13 දක්වා වූ ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල්

රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ගණන්දීමේ නිලධාරි වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටුකර තිබුණු බව නිරීක්ෂණය විය.

| **මුදල් රෙගුලාසි 128(1) ප්‍රකාර ගණන්දීමේ නිලධාරිගේ ගිණුම් කටයුතුභාවය** | | **ගණන්දීමේ නිලධාරි එම විධිවිධානයට අනුගතවී නොතිබීම** | **නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|---|
| **මුදල් රෙගුලාසිය** | | | |
| 128 (1) (අ) | රජය විසින් නියමකර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබූ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසාදීමෙහිලා පාර්ලිමේන්තුවේ අභියෝගයන් ගැන සැලකිල්ලට ගෙන තම දෙපාර්තමේන්තුවේ කටයුතු විචක්ෂණ භාවයෙන් යුක්තව සැලසුම්කර ක්‍රියාත්මක කරන බව සහ ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩසටහන සම්පූර්ණ කිරීමට සහ/හෝ නියමිත ඉලක්කය සාක්ෂාත් කර ගැනීමට පරිශ්‍රමයක් දක්වා තිබීම. | 1. ක්‍රියාකාරී සැලැස්ම නිසි පරිදි පිළියෙල කර නොතිබීම.<br>2. අයවැය ඇස්තමේන්තු තාත්වික ලෙස පිළියෙල නොකිරීම<br>3. අග්‍රිම ඇස්තමේන්තු පිළියෙල කිරීමේ අඩුපාඩු | 2.3.1<br>2.9(අ)<br>2.11 |
| 128(1)(ආ) | තම දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය හා ගිණුම්කරණය සඳහා සංවිධානය සාර්ථක බවට සහ අවශ්‍ය අවස්ථාවලදී රජයට ලැබිය යුතු ගාස්තු නිවැරදිව නිශ්චය කිරීමට ඒවා ක්‍රමානුකූලව ද සම්පූර්ණයෙන්ම ද අප්‍රමාදව ද එකතු කර ගැනීමට සහ ලැබෙන මුදල් ගිණුම්ගත කිරීමටදඹ රජය වෙනුවෙන් වගකීම්වලට බැඳීම් සඳහා බලය දීමටද ඉටුකරන ලද සේවාවන් සැපයීම් අධීක්ෂණය හා පරීක්ෂා කිරීමට සහ එම රජයේ අරමුදලින් ඒ සඳහා අප්‍රමාදව හා නිවැරදිව ගෙවීම් කිරීමට ඉන් ප්‍රමාණවත් තරම් විධිවිධාන සලසා තිබීම. | 1. මහජනතාවට සේවාවන් ඉටුකිරීමේ දුර්වලතා<br>2. ව්‍යාපෘති නිමකිරීමේ ප්‍රමාදයන් | 2.8, 2.9(ඇ)(i) – (v)<br>2.3.2 |
| 128(1)(ඉ) | රජය සතු වූ හෝ රජයේ භාරයේ පවත්නා මුදල් බඩුබාහිර උපකරණ හා වෙනත් වත්කම් සුරක්ෂිතව තබා ගැනීම සහ සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් තරම් සහ විධිමත් විධිවිධාන යොදවනු ලබන බව, ඒවා වරින්වර සත්‍යාපනය කරනු ලබන බවටත්, ඒවා නිසියාකාරව නිෂ්කාශණය කරනු ලබන කල්හි එසේ නිෂ්කාශණය කිරීම නියමිත රෙගුලාසි වලට හා උපදෙස් වලට අනුකූලව කරනු ලබන බව | වත්කම් කළමනාකරණයේ අඩුපාඩු | 2.4 |

| | | | |
|---|---|---|---|
| 128(1)(ඌ) | හිඟව තිබෙන ගාස්තු යනාදිය අයකර ගැනීමට විශේෂ විධිවිධාන යොදන බවට සහ එම කාර්යය පැවරී ඇති නිලධාරීන් විසින් හිඟ මුදල් පිළිබඳව ඒවා අයකර ගැනීම කඩිනම් කිරීමට ගනු ලැබූ පියවර පිළිබඳව යටත් පිරිසෙන් තුන් මාසයකට වරක් හෝ අන්‍යාකාරයකින් විධානය කළ පරිදි හෝ තමා වෙත වාර්තා කරන බව | රජයේ නිලධාරීන් අත්තිකාරම් ගිණුමේ හිඟහිටි ණය ශේෂ අයකර ගැනීම | 2.10 |
| 128(1)(ක) | ගණන්දීමේ නිලධාරියා වශයෙන් තමා වගකීමට බැඳී සිටින වියදම් ශීර්ෂයක එක් එක් වැඩසටහන වෙනුවෙන් මුදල් වර්ෂය අවසානයේදී විසර්ජන ගිණුමක් ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත ඉදිරිපත් කරනු ලබන බව | විසර්ජන ගිණුමේ සඳහන් කර ඇති අඩුපාඩු | 2.9(ආ) |
| 128(1)(ජ) | නිලධාරීන්ගේ/සේවකයින්ගේ ප්‍රමාදය, නොසැලැකිල්ල, වරද හෝ වංචාව නිසා රජයට පාඩු සිදු වී ඇති අවස්ථාවලදී මුදල් රෙගුලාසි 103 සිට 108 දක්වා රෙගුලාසිවල නියම කර ඇති කාර්ය පරිපාටිය ගණන්දීමේ නිලධාරීන් විසින් අනුගමනය කරනු ලබන බවටද, මුදල් රෙගුලාසි 156(1) අනුව එම පාඩු සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්/සේවකයන් මත අධිභාර පනවනු ලබන බව | 1. පාඩු හා හානි<br>2. මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ වූ ගනුදෙනු | 2.7<br>2.6 |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

## 2.1 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යයන්

(අ) දිළිඳුකම අඩුකිරීමේ කාර්යයන් සම්බන්ධ කළමනාකරණය හා බෙදාහැරීම.

(ආ) ආපදා සහන ව්‍යාපෘති හා පුනරුත්ථාපන ව්‍යාපෘති පරිපාලනය කිරීම.

(ඇ) සංවර්ධන ව්‍යාපෘති සැලසුම් කිරීම හා අධීක්ෂණය කිරීම.

(ඈ) මැතිවරණ රාජකාරී සම්බන්ධීකරණය.

(ඉ) දිස්ත්‍රික්කයේ ව්‍යාපෘතිවල පරිපාලනය හා මෙහෙයවීම.

(ඊ) ජාතික හැඳුනුම්පත් හා විදේශ ගමන් බලපත්‍ර පිළිබඳ ඉල්ලුම් පත්‍ර භාර ගැනීම.

(උ) ආදායම් එකතු කිරීම.

(ඌ) ආපදා සහනාධාර ක්‍රියාකාරීත්වය සංවිධානය රාජ්‍ය නොවන ජාත්‍යන්තර, රාජ්‍ය නොවන සංවිධානවල ආධාරයෙන් මානව සම්පත් සංවර්ධන ක්‍රියාකාරීත්වය.

(එ) මානව සම්පත් සංවර්ධන ක්‍රියාවලිය.

## 2.2 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ආයතන හා එමගින් ඉටු කළ යුතු කාර්යභාරයන්

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ස්ථාපිත කර ඇති ආයතන හා ඒවායේ කාර්යභාරයන් පහත දැක්වේ.

| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල | ස්ථාපිත කිරීමේ අධිකාරී බලය | කාර්යභාරය |
|---|---|---|
| (i) කෝරලෙයිපත්තු<br>(ii) කෝරලෙයිපත්තු උතුර<br>(iii) කෝරලෙයිපත්තු බටහිර<br>(iv) කෝරලෙයිපත්තු දකුණ<br>(v) කෝරලෙයිපත්තු මධ්‍යම<br>(vi) ඒරාවූර් නගරය<br>(vii) ඒරාවූර් පත්තු<br>(viii) මන්මුනෙයි උතුර<br>(ix) මන්මුනෙයි බටහිර<br>(x) මන්මුනෙයිපත්තු<br>(xi) මන්මුනෙයි දකුණ එරුවිල්පත්තු<br>(xii) කාත්තාන්කුඩි<br>(xiii) පෝරතිවුපත්තු<br>(xiv) මන්මුනෙයි නිරිත | 1992 අංක 58 දරන ප්‍රාදේශීය ලේකම් කාර්යාල පිහිටුවීමේ පනත | මධ්‍යම රජයෙන් සහ පළාත් සභාවලින් පවරනු ලබන පහත සඳහන් පරිපාලන හා සංවර්ධන කාර්යභාරයන් ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක කිරීම<br>• ඉල්ලීම් ලිපි, ආකෘති පත්‍ර, පදිංචි සහතිකයේ අත්සන් තැබීම.<br>• තොරතුරු දැනගැනීමේ පනත යටතේ තොරතුරු ලබාදීම.<br>• ජාතික හැඳුනුම්පත් බෙදාහැරීම.<br>• ඉඩම් අනුමත කිරීමේ පත්‍ර ලබාදීම.<br>• දිළිඳුකම අඩුකිරීමේ කාර්යයන්වල නිරත වීම.<br>• මරණ උපත් සහතික ලබාදීම.<br>• වෛද්‍යාධාර ගෙවීම් ලබාදීම.<br>• සමිති ලියාපදිංචි කිරීම.<br>• වාහන අනුමත කිරීමේ බලපත්‍ර ලබාදීම.<br>• කොන්ත්‍රාත් කාර්යයන්වල නිරත වීම. |

## 2.3 කාර්යසාධනය

### 2.3.1 සැලසුම් කිරීම

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය ප්‍රකාරව, 2017 වර්ෂය සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර තිබුණි. ඒ අනුව, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඉටු කළ යුතු ප්‍රධාන කාර්යයන් 14,777 දක්නට ලැබු අතර, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ස්ථාපිත කර තිබූ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 14 ක අපේක්ෂිත ප්‍රතිඵල ලබාගැනීම සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්ම සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) අපේක්ෂා කළ ප්‍රධාන කාර්යයන් 14,777 කින් ඉටු කළ හැකි ආකාරයේ කාර්යයන්; 12,553 ක් පමණක් ඇතුළත් කර තිබුණි. එය ඇස්තමේන්තු කළ ප්‍රතිපාදනයෙන් සියයට 69 ක් වී

තිබුණි. එලෙස, සියළුම කාර්යයන් ඉටු නොකිරීමෙන් සලසා තිබුණු ප්‍රතිපාදනවලින් සියයට 31 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ යාවත්කාලීන කරනු ලැබූ සංවිධාන සැලැස්ම අනුමත කළ කාර්ය මණ්ඩලය සහ දැනට සේවයේ නියුක්ත කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) වාර්ෂික කාර්යභාරයන් සඳහා අග්‍රිම අවශ්‍යතා සැලැස්ම (Imprest Requirment Plan), ක්‍රියාකාරකම් සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

**2.3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම**

**ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත සඳහන් ව්‍යාපෘතීන් ඉටුකිරීමේ ප්‍රමාදයන් නිරීක්ෂණය විය.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත | ආරම්භ කළ දිනය | නිම කළ යුතු දිනය | නිම කළ දිනය | 2017 දෙසැම්බර් 31 දිනට වියදම | ප්‍රමාදයට හේතු |
|---|---|---|---|---|---|---|
| | රු.මිලියන | | | | රු.මිලියන | |
| රෝහල් ගොඩනැගිල්ල ඉදිකිරීම. නාවට්කාඩු මන්මුනෙයි බටහිර | 3 | 07.07.2017 | 06.10.2017 | 10.04.2018 | 2.56 | අදාළ කාලය තුළ ඇතැම් අවසන් වැඩ කොටස් කොන්ත්‍රාත්කරු ලවා සම්පූර්ණ කර ඉටුකරවා ගැනීමට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් කටයුතු කර නොතිබීම. |
| ධීවර නේවාසිකාගාරය කෝරලෙයිපත්තු | 5.5 | 06.10.2017 | 14.12.2017 | 23.03.2018 | 5.44 | සඳහන් කාල පරාසය තුළ අදාළ නේවාසිකාගාරය සම්පූර්ණ කිරීමට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාමාර්ග නොගැනීම. |

**2.4** **වත්කම් කළමනාකරණය**

**නිෂ්කාර්ය වත්කම්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත වර්ග කර ඇති වත්කම් නිෂ්කාර්යව පැවැති බව නිරීක්ෂණය විය.

| | වත්කම් වර්ගය | ඒකක ගණන | නිෂ්කාර්යව පැවැති කාලපරිච්ඡේදය |
|---|---|---|---|
| (i) | මෝටර් වාහන | 48 | වර්ෂ 10 |
| (ii) | වතුර පොම්ප | 200 | වර්ෂ 01 - 27 දක්වා |

**2.5** **බැරකම් සහ බැඳීම්**

**නිරවුල් නොකළ බැරකම්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයිති ගොඩනැගිල්ල වෙනුවෙන් මඩකලපුව මහනගර සභාවට 2006 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා ගෙවිය යුතු රු.190,668 ක වරිපනම් බදු 2018 මැයි 31 දින වන විටත් නිරවුල් කර නොතිබුණි.

**2.6** **මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු**

නියැදි විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ වංචනික ස්වරූපයේ වූ ගනුදෙනු පිළිබඳ විස්තර තොරතුරු පහත දැක්වේ.

(අ) මන්මුනෙයි උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සුනාමි නැවත පදිංචි කිරීමේ නිවාස ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා තිරායිමඩුහි (Thiraimadu) රජයට පවරා ගත් ඉඩම් සඳහා නීතිවිරෝධී ව්‍යාජ ලේඛන ඉදිරිපත් කළ පුද්ගලයින් තිදෙනෙකුට රු.මිලියන 6.3 ක වන්දි ලබාගැනීම සඳහා අනුමැතිය ලබාදුන් වගකිව යුතු නිලධාරියාට එරෙහිව කිසිඳු විනය පරීක්ෂණ ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) දිවි නැඟුම දෙපාර්තමේන්තුවේ දිරිය සවිය ණය සැලැස්ම යටතේ අලුතින් සහනාධාර ලබාගැනීමට සුදුසුකම් ලැබූ අඩු ආදායම්ලාභීන්ට කෝරලෙයිපත්තු දිවිනැඟුම ප්‍රජාමූල බැංකුව විසින් ලබාදුන් ප්‍රතිලාභීන් 09 දෙනෙකුගේ ණය මුදල් හා ඔවුන්ගේ ඉතිරි කිරීමේ ගිණුම්වලින් රු.325,000 ක මුදල් දිවිනැඟුම ප්‍රජාමූල බැංකුවේ රාජකාරී කරන සේවකයින් විසින් වංචනික ලෙස ලබාගෙන තිබූ බවට, එම බැංකුවේ කළමනාකරු, නිලධාරීන් සහ එම ප්‍රතිලාභීන් විසින් ලබාදුන් ලිඛිත සාක්ෂි මඟින් සනාථ කර තිබූ නමුත්, අදාළ නිලධාරීන්ට විරුද්ධව මේ දක්වා විනය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**2.7** **පාඩු හා හානි**

---------------

2011, 2012, 2014 සහ 2017 ආදී වර්ෂවල සිදු වූ වාහන අනතුරුවලින් රු.1,323,289 ක් හානි සිදු වී තිබූ නමුත්, මේ සම්බන්ධයෙන් විගණන දින වන විටත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

**2.8** **කළමනාකරණ දුර්වලතා**

-------------------------

විගණන නියැදි පරීක්ෂාවේදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) කෝරලෙයිපත්තු මධ්‍යම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රැකියා විරහිත තරුණ තරුණියන් 500 දෙනෙකුට රැකියා අවස්ථා ලබාදීමේ අරමුණෙන් ඇඟළුම් කර්මාන්තශාලා ස්ථාපිත කිරීමට එක් පුද්ගලික ආයතනයකට වර්ෂ 30 කාලයක් සඳහා රු.මිලියන 30 ක බදු වටිනාකමට ලබා දී තිබූ හෙක්ටයාර 0.46 ක ඉඩම අදාළ අරමුණු සඳහා භාවිතා කර නොතිබූ හෙයින් ප්‍රාදේශීය ලේකම්වරයා විසින් එම ඉඩම වෙනත් පුද්ගලික ආයතනයකට සංචාරක නිකේතනයක් ඉදිකිරීම සඳහා ආයෝජන මණ්ඩලය, ඉඩම් කොමසාරිස් ජනරාල් සහ දිස්ත්‍රික් ලේකම්වරයාගේ අනුමැතියකින් තොරව ලබා දී තිබුණි. මෙම ඉඩම මෙලෙස මහජනයා පදිංචි ප්‍රදේශයක ජනතාවගේ සංස්කෘතියට බලපෑම් ඇති කිරීමේ සැලසුමෙන් ලබා දී තිබූ හෙයින් ඒ සම්බන්ධයෙන් මේ දක්වා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ අංක 06/2016 දරන චක්‍රලේඛය ප්‍රකාරව, ගර්භනී මව්වරුන්ට මාස 10 කට පෝෂ්‍යදායී ආහාර ද්‍රව්‍ය නිකුත් කිරීම සඳහා ඉල්ලුම්පත් අදාළ කාලසීමාව තුළ ලබා දී ඔවුන්ගේ අවශ්‍යතාවයන් සම්පූර්ණ කිරීම සඳහා හා ආහාර ද්‍රව්‍ය ලබා දිය යුතු බව සඳහන් කළත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 14 ක් විසින් ලබාගෙන තිබූ ඉල්ලුම් පත් අදාළ අවශ්‍යතාවයන් සම්පූර්ණ නොකිරීම හේතුවෙන් දින 02 සිට 210 කට අධික කාල පරාසයකට අයත් රු.55,308,000 ක් වටිනා වවුචර් පත් 2,654 ක කාලය ඉකුත් වී තිබූ බව නිරීක්ෂණය විය.

(ඇ) මන්මුනෙයි නිරිත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මාවඩිමුනෙයිමාරි ප්‍රදේශයේ ජනතාවට වෛද්‍ය සේවාවන් ලබාදීම සඳහා සමාලෝචිත වර්ෂයේ රු.2,868,238 ක වියදමින් ඉදිකරනු ලැබූ මධ්‍යම බෙහෙත් ශාලා ගොඩනැගිල්ල 2018 ජුනි 29 දින වන විටත් අදාළ අරමුණු සඳහා භාවිතා කර නොතිබුණි.

(ඇ) ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය විසින් දියවර පියස වැඩසටහන යටතේ ධීවර පවුල් 54 කට සනීපාරක්ෂක පහසුකම් සැපයීමේ ව්‍යාපෘතිය සඳහා 2017 වර්ෂයේ කෝරලෙයිපත්තු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ලබාදෙනු ලැබූ ප්‍රතිපාදනවලින් ධීවර පවුල් 37කට ගෙවීම් නිසි පරිදි ලබානොදීම හේතුවෙන් ඔවුන්හට සනීපාරක්ෂක පහසුකම් ලබාගත නොහැකි වූ අතර ධීවර පවුල් 17ක් සඳහා වෙන්කළ ප්‍රතිපාදනයෙන් සුදුසු ප්‍රතිලාභීන් තෝරා නොගැනීම හේතුවෙන් රු.510,000ක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි.

(ඉ) මන්මුනෙයි උතුර ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ රු.1,485,000 ක වියදමින් ඉදිකර 2018 මැයි 17 දින නිම කරන ලද ප්‍රජා මධ්‍යස්ථානය මේ දක්වා අදාළ අරමුණු සඳහා උපයෝජනය කර නොතිබුණි.

(ඊ) මන්මුනෙයි උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් දීර්ඝ කාලීන බදු පදනමින් ලබාදෙනු ලැබූ ඉඩම් සඳහා රු.90,000 ක වාරික මුදල් අයකර ගැනීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි.

(උ) විවිධ පුද්ගලික සන්නිවේදන සමාගම් විසින් 2009 වර්ෂයේ සිට නීතිවිරෝධී ලෙස රජයේ ඉඩම්වල ඉදිකරනු ලැබූ සන්නිවේදන කුළුණු සම්බන්ධයෙන් ඒරාවුර්පත්තු සහ කෝරලෙයිපත්තු උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

## 2.9 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 2013 | පුනරාවර්තන | 542.5 | 527.9 | 14.6 | 2.7 |
| | මූලධන | 974.2 | 974.1 | 0.1 | - |
| | **එකතුව** | **1,516.7** | **1,502** | **14.7** | **1** |
| 2014 | පුනරාවර්තන | 443.3 | 442.2 | 1.1 | 0.2 |
| | මූලධන | 231.6 | 231.6 | - | - |
| | **එකතුව** | **674.9** | **673.8** | **1.1** | **0.2** |
| 2015 | පුනරාවර්තන | 543.7 | 538.2 | 5.5 | 1 |
| | මූලධන | 214.3 | 63.2 | 151.1 | 70.5 |
| | **එකතුව** | **758** | **601.4** | **156.6** | **20.7** |
| 2016 | පුනරාවර්තන | 574 | 569.3 | 4.7 | 0.8 |
| | මූලධන | 323 | 304.8 | 18.2 | 5.6 |
| | **එකතුව** | **897** | **874.1** | **22.9** | **2.6** |
| 2017 | පුනරාවර්තන | 577.6 | 574.4 | 3.2 | 0.6 |
| | මූලධන | 274 | 162.7 | 111.3 | 40.6 |
| | **එකතුව** | **851.6** | **737.1** | **114.5** | **13.4** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) **අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීම**

**කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම් කළ කාල වකවානු සැලකිල්ලට නොගෙන ප්‍රතිපාදන සලසා ගැනීම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් නව දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීමේ කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තුව ප්‍රකාරව, අවශ්‍ය සම්පූර්ණ ප්‍රතිපාදනයම සලසා තිබූ නමුත්, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ශක්‍යතා අධ්‍යයනයන් සහ ප්‍රසම්පාදන ක්‍රියාවලියට සම්බන්ධිත ක්‍රියාකාරකම් පමණක් සම්පූර්ණ කර

තිබීම හේතුවෙන්, සලසා තිබූ මුළු ප්‍රතිපාදනයෙන් රු.මිලියන 110.5 ක් හෙවත් සියයට 58 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.

**(ආ) විසර්ජන ගිණුම**

------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i) අධිවැය**

-----------

පුනරාවර්තන වැය විෂයයක් වෙනුවෙන් රු.934,050 ක අධි වැය ඇති වී තිබුණි.

**(ii) අධි ප්‍රතිපාදන සලසා තිබීම**

------------------------------

මූලධන වැය විෂයයන් 2 ක් සඳහා එකතුව රු.මිලියන 2.7 ක අධි ප්‍රතිපාදන සලසා තිබූ අතර එම වැය විෂයයන් සඳහා සලසා තිබූ ප්‍රතිපාදනවලින් එකතුව රු.මිලියන 2.16 ක් පමණක් උපයෝජනය කර තිබීම නිසා සලසා තිබූ මුළු ප්‍රතිපාදනයෙන් සියයට 20 සිට සියයට 22 දක්වා වන පරාසයක ඉතිරිවීම් පැවතුණි.

**(ඇ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය**

------------------------------------------------------------------------------------------විවිධ කාර්යයන් සඳහා අමාත්‍යාංශ 30 ක් සහ දෙපාර්තමේන්තු 19 ක් විසින් එකතුව රු.2,922,286,613 ක ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාල සඳහා ලබා දී තිබූ අතර එම ප්‍රතිපාදනවලින් පිළිවෙලින් රු.2,540,689,854 ක් සහ රු.60,091,960 ක් වශයෙන් එකතුව රු.2,600,781,814 ක ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි. ඒ අනුව, සමාලෝචිත වර්ෂය අවසාන වන විට පිළිවෙලින් රු.319,046,955 ක් සහ රු.2,457,844 ක් වශයෙන් එකතුව රු.321,504,799 ක හෙවත් සලසා තිබූ ප්‍රතිපාදයෙන් පිළිවෙලින් සියයට 11 ක් හා සියයට 1 ක් ඉතිරිකිරීම් දක්නට ලැබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i) සින්නක්කාලයපෝට්ටමඩු ඉලුප්පඩිච්චේනෙයි ඇල මාර්ගය ප්‍රතිසංස්කරණය**

-------------------------------------------------------------------------------

මන්මුනෙයි බටහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සින්නක්කාලපෝට්ටමඩු ඉලුප්පච්චේනෙයි ඇල මාර්ගය ප්‍රතිසංස්කරණය සඳහා රු.4,704,000 ක වටිනාකමට කොන්ත්‍රාත්වලට එළඹ එම කාර්යයන් 2017 සැප්තැම්බර් 06 දින නිම කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

- රු.5,187,771 ක් වටිනා ඇල මාර්ගය ප්‍රතිසංස්කරණ කාර්යයන් ඇස්තමේන්තු නොකර පුවත්පත් දැන්වීමෙහි රු.5,880,000 ක මිලකට ප්‍රාදේශීය ලේකම්වරයා විසින් ප්‍රසිද්ධ මිල කැඳවීම් සිදු කර තිබූ බැවින් රු.692,229 ක් කොන්ත්‍රාත්කරුට වැඩියෙන් ගෙවීම් කර තිබුණි.

- ඇල මාර්ගයෙහි ඇති අමුණෙහි ජලය ගලායන බිත්තියෙහි ඉහළ කොටසේ පස සේදීයාම වැලැක්වීම සඳහා අතිරේක හරස් බිත්තියක් ඉදි නොකිරීමෙන්, හිඩැස් නොතැබීමෙන් බිත්තියේ ඇතුළත හා පිටත ප්‍රදේශවල ස්ථාන 14 ක් ඉරිතැලීම් සිදු වී තිබුණි.

- මෙම ඇල මාර්ගයේ ජලය ගලායන බිත්තියේ වැඩ ආරම්භ කිරීමට ප්‍රථම නියමිත ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර, ස්ථානයට සුදුසු පරිදි ඇස්තමේන්තු

පිළියෙල නොකිරීමෙන් සහ වගකිව යුතු නිලධාරීන්ගේ ප්‍රමාණවත් අධීක්ෂණයක් නොමැති වීම හේතුවෙන් ඉදිකරනු ලැබූ ජලය ගලායන බිත්ති ඇද වී කඩා වැටී තිබීම නිරීක්ෂණය විය. මේ නිසා එම ප්‍රදේශයේ තිබෙන අක්කර 500 ක කුඹුරු ඉඩම් සඳහා ගොවිතැන් සඳහා ජලය ලබාගැනීමට නොහැකි තත්ත්වයක් උද්ගත වී තිබුණි. මේ අනුව මෙම ඇල මාර්ගය ප්‍රතිසංස්කරණය සඳහා සිදුකළ වියදම් නිෂ්ඵල වී තිබුණි.

**(ii) මඩකලපුව වැවේ සීමා කිරීමේ සැලැස්ම**

----------------------------------------

මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් මඩකලපුව වැඩ සීමා නිර්ණය කිරීමේ වැඩසටහන යටතේ කොන්ක්‍රීට් කණු 12,800 ක් සිටුවීම සඳහා 2015 හා 2016 වර්ෂවලදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට රු.37,864,000 ක ප්‍රතිපාදන සලසා තිබුණි. මේ සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- මෙම ව්‍යාපෘතිය සඳහා වෙන්කරනු ලැබූ ප්‍රතිපාදන උපයෝගී කරගෙන කොන්ක්‍රීට් කණු සිටුවීම සඳහා අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබාගත යුතුව තිබුණත් මෙය නවතාලීම සඳහා මෙම දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් නියම කරනු ලබන ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලැබ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 මාර්ගෝපදේශයට පටහැනිව කොන්ත්‍රාත්කරුවන් තිදෙනෙකු අතර එකම මොහොතක ගිවිසුම් සඳහා අත්සන් කර තිබුණි.

- කොන්ක්‍රීට් කණුවල ඉහළ කොටසේ කොන් නැමිය යුතු බවට අනුමත කරනු ලැබූ ඇස්තමේන්තුවේ සඳහන් තිබුණත් මෙය සැලකිල්ලට නොගෙන කණු 3,837 ක ඉහළ කොටස් ඇස්තමේන්තුව ප්‍රකාරව නැමීමට කටයුතු නොකර දික් අතට තිබීම දක්නට ලැබුණ.

- අනුමත කරනු ලැබූ කොන්ක්‍රීට් කණුවල ඡායාරූප අනුව මි.මි.450 ක් පස්වලට යටකර ද මි.මි.900 ක් පොළොව මතුපිට කොටසෙහිද පෙනෙන ආකාරයෙන් වන පරිදි සිටුවිය යුතු වුවත් කොන්ක්‍රීට් කණු පිළිවෙලින් 1,055 ක් මි.මි.200 ක් පස්වලට යටකරද කණු 1,219 ක් මි.මි.750-800 ක් අතර පසෙහි බාහිර කොටසෙහි ද වන පරිදි සිටුවා තිබූ බවටත් තාක්ෂණික නිලධාරියාගේ ලිඛිත වාර්තා අනුව සනාථ කර තිබුණි.

- වැව සීමා කිරීමේ කටයුතු සඳහා සිටුවා නොතිබූ කොන්ක්‍රීට් කණු 3,713 ක් අදාළ අරමුණු සඳහා උපයෝගී නොකර වෙරළාසන්න දියකඩිති සීමා කිරීමේ කටයුතු සඳහා භාවිතා කර තිබුණි.

**(iii) ජීවනෝපාය ආධාර සැලැස්ම යටතේ එළුවන් ලබාදීම**

----------------------------------------------------

බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීමේ සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශයන් ජීවනෝපාය සංවර්ධන සැලැස්ම යටතේ ප්‍රතිලාභීන් 98 දෙනෙකුට එළුවන් ලබාදීමේ ව්‍යාපෘතිය සඳහා 2017 වර්ෂයේ කෝරලෙයිපත්තු උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට රු.9,800,000 ක ප්‍රතිපාදන සලසා තිබුණි. මේ

සම්බනධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- මිලදී ගනු ලබන එළුවන් වයස අවුරුදු 01 සිට 02 අතරත් කිලෝ ග්‍රෑම් 25 සිට 35 අතර බර ප්‍රමාණයක තිබිය යුතු බවට ලංසු කැඳවීමේ ලේඛනවල VI හි තාක්ෂණ තොරතුරුවල සඳහන් කර තිබුණත් මෙයට පටහැනිව වයස අවුරුදු 01 ට අඩු සහ වයස අවුරුදු 02 ඉක්මවූ එළුවන් 180 ක් සහ කිලෝ ග්‍රෑම් 25 ට අඩු එළුවන් 184 ක් ද ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් මිලදී ගෙන ඒ සඳහා ගෙවීම්ද සිදුකර තිබුණි.

- මිලදී ගනු ලැබූ එළුවන් 380 හි සෞඛ්‍ය තත්ත්වය හා ඉහත සඳහන් ලංසු කැඳවීමේ ලේඛනවල සඳහන් කර තිබූ තාක්ෂණික තොරතුරු ආදිය පරීක්ෂා කිරීමකින් තොරව ප්‍රතිලාභීන් වෙත ලබා දී තිබූ බැවින් ප්‍රතිලාභීන් වෙත ලබාදෙනු ලැබූ එළුවන්ගෙන් එළුවන් 13 ක් ලබා දී මාසයක් ඇතුළත මිය ගොස් ඇති බව ප්රතිලාභීන් විසින් ලබා දී තිබූ ලිඛිත සාක්ෂි අනුව තහවුරු වී තිබුණි.

**(iv) අභ්‍යන්තර අර්බුද හේතුවෙන් අවතැන්ව නැවත පදිංචි කළ අය සඳහා නිවාස ඉදිකිරීමේ ව්‍යාපෘතිය**

---

ඒරාවූර් පත්තු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අභ්‍යන්තර ත්‍රස්තවාදී ගැටළු හේතුවෙන් අවතැන් වූ අයට අලුතින් නිවාස 107 ක් ඉදිකිරීම සඳහා 2017 වර්ෂයේදී බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචිකිරීමේ හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය හරහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට රු.මිලියන 856 ක ප්‍රතිපාදන සලසා තිබුණි. අමාත්‍යාංශ ලේකම්වරයා විසින් නිකුත් කළ චක්‍රලේඛය ප්‍රකාරව, වැඩිම ලකුණු ලබාගන්නා ප්‍රතිලාභීන් පමණක් ප්‍රමුඛතා ලබාදීමේ පදනමින් තෝරාගත යුතු වුවත්, එම ප්‍රදේශයේ ලකුණු 80 කට වැඩි ප්‍රමාණයක් ලබාගත හැකි ප්‍රතිලාභීන් විශාල ප්‍රමාණයක් දක්නට ලැබුණත් මෙය නොතකා ලකුණු 45 සිට 80 දක්වා වන අඩු ලකුණු ප්‍රමාණයක් ලබාගත් ප්‍රතිලාභීන් චක්‍රලේඛයට පටහැනිව තෝරාගෙන ඔවුන්ට නව නිවාස ඉදිකිරීම සඳහා ප්‍රාදේශීය ලේකම්වරයා විසින් ගෙවීම් සිදුකර තිබුණි.

**(v) ගංවතුර ආපදා අවම කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම**

---

ආසියානු සංවර්ධන බැංකුව සහ ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් ගංවතුර ආපදා අවම කිරීමේ ව්‍යාපෘතිය යටතේ මන්මුනෙයි දකුණ එරුවිල්පත්තු ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයට අයත් සෙට්ටිපාලයම් (Settipalayam) උතුර ග්‍රාම සේවක කොට්ඨාශයේ පියන් සහිත කාණු පද්ධතිය ඉදිකිරීම සඳහා 2017 වර්ෂය අවසානය දක්වා රු.මිලියන 15.7 ක් වැය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- මෙම ව්‍යාපෘතිය සඳහා ආසියානු සංවර්ධන බැංකුව විසින් ලබාදුන් රු.මිලියන 12.5 ක ප්‍රතිපාදන උපයෝජනය කර සෙට්ටිපාලයම් උතුර ග්‍රාමසේවක කොට්ඨාශයේ මීටර් 365 ක් දිගට කොන්ක්‍රීට් මාර්ගයක් සහ කාණු පද්ධතියක් ඉදිකළ යුතු බවට ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් යවනු ලැබූ 2016 දෙසැම්බර් 27 දිනැති අංක MDM/PD/ADB/2016 දරන ලිපියේ සඳහන් කර තිබූ නමුත් මෙයට පටහැනිව මීටර් 346 ක දිගට පමණක් පියන් සහිත කාණු ඉදිකිරීම සඳහා රු.මිලියන 10.4 ක වටිනාකමට

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් කොන්ත්‍රාත් පිරිනමා ගෙවීම් ද සිදුකර තිබුණි.

- ඉහත සඳහන් ව්‍යාපෘතිය සඳහා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය හරහා ආසියානු සංවර්ධන බැංකුව විසින් ලබාදෙනු ලබන ප්‍රතිපාදන 2017 ජූනි 13 දින සිට නවතනු ලබන බව සැලකිලිමත් නොවී 2017 අගෝස්තු 02 දින වන විට කාණු පද්ධතිය නිම කිරීම සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් කොන්ත්‍රාත් පිරිනමා තිබුණි. මේ නිසා ඉහත සඳහන් දිනයේ ආසියානු සංවර්ධන බැංකුව විසින් ලබාදුන් ප්‍රතිපාදන නවතා දමා තිබූ බැවින් මීටර් 288 ක් සඳහා කාණු පද්ධතිය ඉදිකර මෙයින් මීටර් 113.5 ක් සඳහා පමණක් පියන් දමා තිබූ අතර මීටර් 32 ක් සඳහා පස් ඉවත් කර තිබියදී අදාළ ව්‍යාපෘතිය අතහැර දමා තිබුණි.

- ගිවිසුමේ කොන්දේසිවලට අනුව වෙනස්කම් සිදුකළ යුතු කාර්යයන්වල ප්‍රමාණයන් සඳහා කොන්ත්‍රාත්කරු විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් අනුමැතිය ලබාගෙන තිබිය යුතුව තිබුණත් කර්මාන්ත 09 ක පරිමාණවල සිදුකළ වෙනස්කම් සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අනුමැතිය නොමැති වෙනස් කිරීම් සිදුකර ඒ සඳහා රු.1,251,430 ක් වැඩිපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් කොන්ත්‍රාත්කරුට ගෙවීම් සිදුකර තිබුණි.

- මෙම ව්‍යාපෘතිය තවත් මීටර් 38 ක් දුරට දීර්ඝ කිරීම සඳහා රු.මිලියන 3.75 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණත් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 මාර්ගෝපදේශයට පටහැනිව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ග්‍රාමීය සංවර්ධන සමිති 02 කට කොන්ත්‍රාත් පිරිනමා තිබුණි.

- මෙම ව්‍යාපෘතිය සෙට්ටිපාලයම් උතුරු ප්‍රදේශයේ ක්‍රියාත්මක කිරීමට කිසිදු යෝජිත වාර්තා මෙන්ම සුදුසු ශක්‍යතා අධ්‍යයනයක් නොමැතිව ආසියානු සංවර්ධන බැංකුව සහ ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් මේ සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසා තිබුණත් මෙම ව්‍යාපෘතිය මඟින් බලාපොරොත්තු වූ අරමුණු ළඟාකර ගැනීමට නොහැකි වී තිබුණි.

## 2.10 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

----------------------------------------

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබූ සීමාවන්**

-----------------------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විෂය අංක 26901 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 44.00 | 44.39 | 28.00 | 34.84 | 125.00 | 111.45 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**හිඟ ණය ශේෂ අයකර නොගැනීම**

-----------------------------------------

විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට පැවැති අයකර ගත යුතු හිඟහිටි ශේෂවල එකතුව රු.169,356 ක් වූ අතර එම හිඟ ශේෂ වර්ෂ 01 සිට වර්ෂ 02 දක්වා කාලයක් ඉක්මවා තිබුණත්, එම හිඟ ශේෂ අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල මට්ටමක පැවති අතර ඒවා අයකර ගැනීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය අපොහොසත් වී තිබුණි.

**2.11 අග්‍රිම ගිණුම්**

--------------

සැලසුම් කළ නිසි කාලවකවානු තුළ අදාළ කාර්යයන් ඉටුනොකර එම කාර්යයන් වර්ෂ අවසානයේ ඉටුකිරීමට කටයුතු කිරීම හේතුවෙන් අවශ්‍ය අග්‍රිම භාණ්ඩාගාරයෙන් නිකුත් කර නොතිබුණි. මේ නිසා රු.390,815,339 ක් වටිනා කාර්යයන් 12 ක් ඉටුකිරීමට නොහැකි වී තිබූ බව නිරීක්ෂණය විය.

**2.12 පොදු තැන්පත් ගිණුම**

-----------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2017 දෙසැම්බර් 31 දිනට පැවැති තැන්පත් ගිණුම් 07 ක ශේෂ එකතුව රු.133,006,403 ක් විය. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ කෝවිල් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ලැබී තිබුණු රු.200,000 ක මුදල උපයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) භාණ්ඩාගාරය විසින් පවත්වාගෙන යනු ලබන තැන්පත් ගිණුමේ රු.563,837 ක් 1983 වර්ෂයේ සිට අඛණ්ඩව දක්නට ලැබුණත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පවත්වාගෙන යනු ලබන ගිණුමේ අදාළ ශේෂය දක්නට නොතිබුණි. කෙසේ වුවද, මෙය හඳුනාගෙන නිරවුල් කිරීම සඳහා පියවර ගෙන නොතිබුණි.

**2.13 මානව සම්පත් කළමනාකරණය**

--------------------------------

**2.13.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

-------------------------------------------------------------------------------------

ඉහත 2.1 ඡේදයේ සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය, පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු.මිලියන 493.61 ක් වැය කර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම රු.510,988 ක් වී තිබුණි.

| සේවක වර්ගය | | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 49 | 47 | 02 | - |
| (ii) | තෘතියික මට්ටම | 44 | 11 | 33 | - |
| (iii) | ද්විතියික මට්ටම | 919 | 778 | 141 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 142 | 122 | 20 | - |
| (v) | වෙනත් (තාවකාලික) | - | 08 | - | 08 |
| | එකතුව | **1,154** | **966** | **196** | **08** |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ රියදුරන් දෙදෙනෙකුගේ අතිරික්තයක් දක්නට ලැබුණත් මෙයට අමතරව වාහන රියදුරන් 03 දෙනෙකු කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන තිබූ අතර අතිරික්ත සංඛ්‍යාව සම්බන්ධයෙන් විධිමත් අනුමැතිය ලබාගැනීමට අපොහොසත් වී තිබුණි.

(ආ) පුරප්පාඩුව පවතින පරිපාලන නිලධාරීන් 06 දෙනෙකුගේ තනතුරු සඳහා ස්ථිර නිලධාරින් බඳවාගෙන නොතිබීමෙන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පරිපාලන කටයුතු දුර්වල මට්ටමක පැවතුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට පැවැති පුරප්පාඩු 196 ක් පිරවීමට සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.